# ගී සඳලුව

Gee... Sandaluwa

සිසිර දිසානායක

# නිලම්බරේ

නව තාක්ෂණයේ පිහිටෙන් අද අපගේ බොහෝ කටයුතු කර්ක්ෂමවත්, පහසුවෙනුත් කරගත හැකි වෙනවා. ගීතයකට තාක්ෂණික පිහිට අවශ්‍ය වෙන්නේ සංගීතය පටිගත කිරීමේදී ගායනය සඳහා හඬ කැවීමේදී හා ඒ පටිගත කරගත් දේ මුසු කිරීමේදීයි. මුලින්ම සංගීතය පටිගත කර, ඒ අනුව ගායන ශිල්පියා පසුව ගායනය කරමින් හඬ පටිගත කිරීමයි දැනට අපගේ ගී පටිගත කිරීමේ පිළිවෙල.

කලකට ඉහතදී මෙම පහසුකම් නොතිබුණ නිසාවෙන් සියල්ල එකට පටිගත කළයුතු වුණා. ගායන ශිල්පියා හෝ එක් වාද්‍ය ශිල්පියෙකු හෝ සුළු අතපසුවීමකින්වත් වැරැද්දක් කළහොත් නැවත සියල්ල පටිගත කළයුතු වෙනවා. එහෙත් අදටත් නව තාක්ෂණයේ පිහිට තිබියදී පවා වෙන් වෙන්ව පටිගත කිරීමට නොහැකි ගී ඇති බව කිවහොත් එය පුදුමයට කාරණයක් වනු ඇති. එවන් ගීයක් සජීවීව පටිගත කරන අවස්ථාවකට සහභාගිවීමට අපි වරම් ලැබුවා. ඒ වික්ටර් රත්නායකයන් ගායනා කරන "හොපළු වනපෙත" ගීතයයි. උත්තර භාරතීය රාගධාරී සංගීතයෙහි එන රාගයක් ඇසුරින් නිර්මාණය වූ ගීය ගායනයේදී ශිල්පියා තානාලංකාරාදීය යොදාගන්නේ එවෙලේම නිර්මාණය කරගනිමින්. හොඳින් සවන් දුනහොත් පටිගත කිරීම් දෙකකදී කළ මෙම ගීයෙහි අලංකාර ඉඳුරාම සමාන නොවෙයි. ගායන ශිල්පියා මතුනොව ප්‍රධාන වාද්‍ය ශිල්පීන්ද ගායනය හා සිය වාදනයන් බද්ධ කරන්නේ ධ්‍යානයකට සම වැදුණු කලෙක මෙනි. ගීයේ භාවයන් ගායකයා මතු නොව වාදකයින් ද අනුගත වන්නේය. මෙම ගීතය පටිගත කිරිමේදී ඊට සමවැද එකී භාවයන්ට අනුගතව ගීතයට උපරිම දායකත්වය දුන් එක් ප්‍රධාන වාද්‍ය ශිල්පියෙකු පිළිබඳවයි "ගී සඳළුව" මෙවර වෙන් වන්නේ.

සැබැවින් ම පසුගිය "ගී සඳළුවෙහි" සුනිල් එදිරිසිංහයන් විශේෂයෙන් සිහිපත් කළ ආනන්ද පෙරේරා ප්‍රවීණ වාද්‍ය ශිල්පියායි ඒ. තනු නිර්මාණකරණයෙ හි දී යෙදෙන ආනන්ද, සුනිලුත් වෙනුවෙන් තනු නිර්මාණය කළ ගීයේ සියළුම වාද්‍ය භාණ්ඩයන් තනිවම වෙන වෙනම පටිගත කළ බවයි අප හට දැනගැනීමට ලැබුණේ. මුලින් සඳහන් කල "හොපළු වන පෙත" ගීත පටිගත කිරීමට ඉඳුරාම වෙනස් අත්දැකීමකි ඒ. තාක්ෂණයේ පිහිටෙන් විටින් - විට, වෙනත් - වෙනත් සංගීත භාණ්ඩ 15ක් පමණ තනිවම වාදනය කළේ ආනන්ද පෙරේරා ශිල්පියාට එම භාණ්ඩ සියල්ල හොඳින් ම වාදනය කිරීමට හැකියාව ඇති නිසා නොවේ ද ?

එම හැකියාව ඉහළම තලයකට ගෙන වේදිකා ප්‍රාප්ත කිරීමට ආනන්ද පෙරේරා ශිල්පියාණන්ට තිර විවර වූයේ "සිහ ශක්ති" කණ්ඩායම තුළින්. සහෝදර අශෝක පෙරේරා ඇතුළු දක්ෂ යෞවන වාද්‍ය හා ගායන ශිල්පීන් කණ්ඩායමකින් සුසැදි "සිහ ශක්ති" කණ්ඩායම බටහිර වාද්‍ය මෙවලම්වලට අමතරව, වයලීන, සිතාර්, මැන්ඩලීන වැනි තත් වාද්‍ය භාණ්ඩ මෙන්ම, බෙර, දවුල්, තම්මැට්ටම්, උඩැක්කි වැනි තාල වාද්‍ය භාණ්ඩ හා හොරණෑ, බටනලා, කලාරිනම් වැනි සුසිර වාද්‍ය භාණ්ඩවලින් සන්නද්ධ වීය. ඔවුන් ගැයූ ගී අතරින් විශාරද නන්දා මාලිනිය හා ගැයූ "නිල්ම්බරේ යන පරෙවි රෑන" ගීතය වඩාත් රසිකයින්ගේ මතකයේ රැඳුණ ගීයකි.



පසුගිය ලිපියේ සඳහන් කළ පරිද්දෙන්ම මේ වන විට රෝගාතුරුව සිටිනා ආනන්ද පෙරේරා ශිල්පියාණන්ව දුරකථනයෙන් මොහොතකට සම්බන්ධ කරගත්තේ නියමිතව ඇති ශල්‍යකර්මයට මුහුණදීමට ධෛර්ය හා නිරෝගී සුව පැතීමටයි.

"ඇත්තටම මගේ පුතාගේ අසනීප තත්ත්වය නිසා 1977 විතර ඉඳන්ම ටිකක් කරදරකාරී තත්වයකුයි තිබුණෙ. ඒ වුණත් ඒ අතරින් මම මගේ ම කියලා ගීත හත අටක් සම්පූර්ණ කරගත්තා. පුතා පිළිකා රෝගයෙන් නැති වුණාට පස්සේ මගේ මේ රෝගී තත්ත්වයත් අළුත් නිර්මාණ කරන එක අඩුවෙන්න හේතුවක් වුණා.

"ඔපරේෂන් එකෙන් පස්සෙත් මාස හය හතක් විවේකීව පරිස්සම්වෙන්න වෙයි. ඉතින් ගෙදර ඉන්න ගමන් මගේ අනික් සින්දු ටිකත් හෙමිහිට කරගන්නයි හිතාගෙන ඉන්නෙ. ඒවා එකතු කරලා මගේ ම සංගත තැටියක් එළිදක්වන එක තමයි මගේ ආශාව." ආනන්ද සොයුරා දුරකථනයෙන් අපහා සම්බන්ධවෙමින් පැවසුවා.

මහනුවර ප්‍රදේශයේ දක්ෂ හා කීර්තිමත් සංගීතාචාර්යරයෙකු වූ සිරිල් පෙරේරා හා සංගීතාචාර්යවරික වූ එම මැතිණියගේ පුත්‍රයෙකි ආනන්ද පෙරේරා. වික්ටර් රත්නායක, නිමල් ගුණසේකර වැනි ප්‍රවීණ ගායකයින්ගේ සංගීතාචාර්යවරයා වූ සිරිල් පෙරේරා මැතිඳුන්ගෙන් සිප් හදාල සිසුහු හයසියයකට වැඩි ප්‍රමාණයක් දිවයින පුරා සංගීතාචාර්යවරුන්, කථිකාරචාර්යවරුන් වශයෙන් සේවය කරති.

ආනන්ද පෙරේරා මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන අතර, මව්පියන් වෙතින් සංගීතයට අත්පොත් තබා ගුවන් විදුලියට වාද්‍යශිල්පියෙකු වශයෙන් සම්බන්ධ විය. ඔහුගේ සැත්කම වෙනුවෙන් මෙන් ම මහනුවර රෝහලේ එම අංශයට අවශ්‍ය උපකරණ ලබාදීම වෙනුවෙන් මූල්‍යාධාර සැපයීමේ අරමුණින් මෙල්බර්න් නුවර උතුරු ඩැංඩිනොං හි මෙන්සීස් ශාලාවේදී සැප්තැම්බර් 10 දා සවස 7.00ට පැවැත්වීමට නියමිත සංගීත ප්‍රසංගය සැබැවින් ම සද්කර්යයක් වන්නේය.

Australian Government

IMPORTANT VISA CHANGES

Changes to how Australia processes irregular maritime arrivals are now in place.

People who come irregularly by boat to Australia seeking asylum and who are intercepted at sea will now be sent to Malaysia.

They will not be processed in Australia.
They will not get a visa to stay in Australia.

For more information go to
www.youtube.com/notopeoplesmuggling

Tell your family, friends and loved ones:
don't risk it—say no to people smugglers.

NO TO PEOPLE SMUGGLING